# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2047/43 - 2017 නොවැම්බර් මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2017.11.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහය - සංශෝධන අංක 01

2014 ජුනි මස 30 දින හා අංක 1869/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමට මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමිය අනුමත කර ඇත.

1. 7.3.2.3 වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ.

   7.3.2.3 පළපුරුද්ද
   නියමිත දිනට මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කොට තිබිය යුතු ය.

   (මේ යටතේ වූ පැහැදිලි කිරීම එලෙසම පවතිනු ඇත)

2. 7.3.2.5 වගන්තිය යටතේ සඳහන් අනුවගන්තින්හී අවසානයට අනු අංක (iv) ලෙස පහත වගන්තිය ඇතුළත් කරනු ලැබේ.

   7.3.2.5 වෙනත්
   (iv) නියමිත දිනට පූර්වාසන්න වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

3. 8.3 වගන්තිය ඉවත් කොට පහත වගන්තිය ආදේශ කරනු ලැබේ.

   8.3 පවත්වන බලධරයා - විභාග කොමසාරිස් ජනරාල් හෝ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද ආයතනයක්

4. 10.3.1.1 ඡේදයේ (අ) (iii) වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත වගන්තිය ආදේශ කරනු ලැබේ.

   (iii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිය සමත් සේවයේ වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරියකු වීම.

1A - PG 3794 — 12 (2017/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

5. 10.3.1.2 ඡේදය ඉවත් කර පහත ඡේදය ආදේශ කරනු ලැබේ.

10.3.1.2 උසස් කිරීමේ ක්‍රමය
අධි ශ්‍රේණියේ පුරප්පාඩු වලින් 50% ප්‍රමාණයකට අදාළ පත්කිරීම් කරනු ලබන්නේ සීමිත තරඟ විභාගයක ප්‍රතිඵල මතය. සීමිත තරඟ විභාගය සමත්වීම සඳහා විභාගයට අදාළ එක් එක් විෂයයන්ට අවම වශයෙන් ලකුණු 40 ක් ලබා ගත යුතු ය. සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව පත් කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය අයදුම්කරුවන්ගේ සුදුසුකම් සනාථ කෙරෙන සහතික පරීක්ෂා කිරීම සඳහා පමණක් වන අතර එහිදී ලකුණු දීමක් සිදුනොවේ. (විෂය නිර්දේශය හා ලකුණු ලබා දීමේ පරිපාටිය 09 ඇමුණුමේ දක්වේ)

6. 10.3.2.2 ඡේදය ඉවත් කර පහත ඡේදය ආදේශ කරනු ලැබේ.

10.3.2.2 උසස් කිරීමේ ක්‍රමය
අධි ශ්‍රේණියේ පුරප්පාඩු වලින් 50% ක ප්‍රමාණයකට අදාළ පත්කිරීම් කුසලතා පදනම මත සිදු කරනු ලැබේ. මේ සඳහා මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අභියෝගතා පරීක්ෂණයකට මුහුණ දී එක් එක් විෂයයන්ට අවම වශයෙන් ලකුණු 40 ක් ලබා සමත් විය යුතු ය. එහි ප්‍රතිඵල මත කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් ජ්‍යෙෂ්ඨතාව හා පළපුරුද්ද පදනම් කරගෙන දෙනු ලබන ලකුණු වල එකතුවේ අනුපිළිවෙල අනුව ප්‍රමුඛත්වය තීරණය කරනු ලැබේ. කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන මණ්ඩලයක් ඉදිරියේ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකට අයදුම්කරුවන් පෙනී සිටිය යුතු ය. එම සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දෙනු නොලැබේ. (ඇමුණුම 10)

7. ඇමුණුම 04 යටතේ ඇති 'සටහන' කොටස වෙනුවට පහත සඳහන් කොටස ඇතුළත් කරනු ලැබේ.

සටහන 01
මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉමට අදාළ පරිගණක පරීක්ෂණයෙන් පහත අවශ්‍යතා සපුරා ඇති නිලධාරීන් නිදහස් කරනු ලැබේ.

01. පහත ආයතන වලින් ලබා දෙන සේවා ව්‍යවස්ථාවේ දක්වෙන පරිගණක පාඨමාලාවේ විෂය නිර්දේශයට සමාන විෂය නිර්දේශයක් යටතේ ඇති පරිගණක පාඨමාලා හදාරා ඇති නිලධාරීන්

a. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA)
b. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය
c. වෘත්තීය පුහුණු අධිකාරිය
d. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ ඇති කාර්මික විද්‍යාල හා තාක්ෂණ විද්‍යාල මගින් පවත්වනු ලබන පාඨමාලා
e. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාල හෝ වෙනත් ආයතන
f. ජාතික තරුණ සේවා සභාව

02. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලියාපදිංචි පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් පරිගණක විද්‍යා උපාධිය හෝ උපාධිය සඳහා පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති නිලධාරීන්

සටහන 02
මෙම සංශෝධන ගැසට් පත්‍රය ප්‍රකාශයට පත්කරන දින සිට වසර 02 ක කාලයක් දක්වා අංක 1869/4 හා 2014.06.30 දිනැති මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවේ ඇමුණුම 04 හි සටහනෙහි දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන නිලධාරීන්ද පරිගණක පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබේ.

ආර්. එම්. එන්. රත්නායක,
ලේකම්,
මධ්‍යම පළාත් සභාවේ
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2017 ඔක්තෝබර් මස 24 දින,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
අංක 244, කටුගස්තොට පාර,
මහනුවර.

12 - 501

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.